**සමෘද්ධි නිවාස සංවර්න ලොතරැයි අරමුදල - 2023**
**-----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

2023 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාලවකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | ------------ | -------------------- | ------------ | ------------ |
| (අ) | 2020 අගොස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 877 (1) (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනය සකස්කර තිබුණද අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිතව මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර එහි පිටපතක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2024 වසරට අදාළව සැකසූ අයවැය ලේඛනය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිතව මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| (ආ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ඡේදය ප්‍රකාරව | 2023 වර්ෂය තුළ අරමුදල විසින් රු. 2,275,900 ක් වූ කාර්යාල උපකරණ මිලදී ගෙන තිබුණු නමුත් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2024 වර්ෂය සඳහා මේ වන විට ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කරමින් පවතින බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.163,400,569 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.652,757,142 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.489,356,573 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට දායක මුදල් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිලාභීන් 5109 ක් වෙනුවෙන් නිවාස ආධාර ලබාදීමේදී ලිපිද්‍රව්‍ය සඳහා රු. 5,151,835 ක් වැයකර තිබුණ නමුත් පසුගිය වර්ෂයේදී ප්‍රතිලාභීන් 6936 කට නිවාස ආධාර ලබාදීම වෙනුවෙන් රු. 445,538 ක් පමණක් වැයකර තිබුණි. ඒ අනුව පසුගිය වර්ෂයට සාපේක්ෂව ප්‍රතිලාභීන් ගණන 1827 කින් අඩු වී ඇතත් ලිපිද්‍රව්‍ය වියදම රු. 4,706,297 කින් වැඩිවී තිබුණි. එය සියයට 1056 ක වැඩිවීමකි. එසේම ඉන්ධන වියදම ද පෙර වර්ෂයට සාපේක්ෂව රු. 2,021,025 සිට රු. 4,127,235 ක් දක්වා රු. 2,106,210 කින් එනම් සියයට 51 කින් වැඩි වී තිබුණි. ඒ අනුව අරමුදල විසින් ලිපිද්‍රව්‍ය හා ඉන්ධන සඳහා ප්‍රතිපාදන ප්‍රාදේශීය හා දිස්ත්‍රික් කාර්යාල වෙත නිකුත් කිරීමේදී කිසිදු පරීක්ෂාවකින් තොරව අවිධිමත් ලෙස නිදහස් කර තිබුණි. | සමාලෝචිත වර්ෂය තුළ ඉන්ධන හා ලිපිද්‍රව්‍ය සඳහා පෙර වසරට සාපේක්ෂව මිල ඉහළ ගොස් ඇති හෙයින් ඒ අනුව පෙර වර්ෂයට වඩා අදාල වර්ෂයේ මුදල් වැඩියෙන් වෙන්කර ලබාදී ඇති බව. | අවශ්‍යතාවය පිළිබඳව පරීක්ෂාවක් සිදුකර ප්‍රතිපාදන නිදහස් කල යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට හඳුන්වා දුන් 2021 අංක 10 දරන දේශීය ආදායම් සංශෝධන පනතේ III වන උපලේඛනය අනුව 2021 අප්‍රේල් 01 දිනෙන් නිවාස සංවර්ධන ලොතරැයි අරමුදලේ ස්ථාවර තැන්පත් සඳහා වන පොලියෙන් බැංකු විසින් රඳවාගෙන ඇති සියයට 5 ක බදු මුදල නිදහස් කර ගැනීමට හැකි වුවත් එම හිමිකම | ස්ථාවර තැන්පතු සඳහා වන පොළී ආදායම් රඳවා ගැනීමේ බද්දෙන් නිදහස් කර දෙන ලෙස ඉල්ලා දේශීය ආදායම් කොමසාරිස් වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇතත් මේ වන තෙක් රඳවා ගැනීමේ බදු නිදහස් කිරීමේ අනුමැතිය මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබී නොමැති බව. | රඳවා ගැනීමේ බදු නිදහස් කිරීමේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| ලබාගැනීමට නොහැකිවීමෙන් 2023 වර්ෂය සඳහා අහිමි වූ පොළී ආදායම රු. 46,218,561 කි. | | |
| (ආ) අරමුදලට අයත් වත්කම් හඳුනාගත හැකිවන පරිදි සමීක්ෂණ වාර්තා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු. 10,603,910 ක්වූ අරමුදල සතු වත්කම් වල පැවැත්ම පිළිබඳ පරීක්ෂා කිරීමට නොහැකි විය. | 2024වර්ෂයට අදාළව භාණ්ඩ සමීක්ෂණය සිදු කිරීමේදී නිවාස සංවර්ධන ලොතරැයි අරමුදලේ වත්කම් වෙන්ව සමීක්ෂණය කර සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දී ඇති බව. | අරමුදල සතු වත්කම් වෙන්ව සමීක්ෂණය කල යුතුය. |

**3.3 කාර්ය සාධනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදලේ ප්‍රතිලාභී පවුල් අතරින් ලොතරැයි දිනුම් ඇදීමක් සිදුකර නිවාස ඉදිකිරීම සඳහා ලොතරැයි ත්‍යාග පිරිනැමීම මඟින් සෑම මාසයක් සඳහාම එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨශයකට එක් නිවසක් බැගින් මාසිකව නිවාස 335 ක් ඉදිකිරිම සඳහා රු. 200,000 බැගින් වූ ත්‍යාග 335 ක් පිරිනැමීම අරමුදලේ ප්‍රධාන කාර්යය වේ. “අස්වැසුම” සුභ සාධන වැඩසටහන 2023 ජුලි මස සිට ක්‍රියාත්මක වීමත් සමඟ සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 397,097 ක් දක්වා අඩුවීමෙන් නිවාස සංවර්ධන ලොතරැයි වැඩසටහන සඳහා ලැබුණ දායක මුදලද ජුලි මස සිට අඩුවී තිබුණි. සමාලෝචිත වර්ෂයේ මුල් අර්ධ වර්ෂය සඳහා රු. 990,598,500 ක් ද ජුලි සිට නොවැම්බර් දක්වා රු. 182,588,500 ක් ද වශයෙන් එකතුව රු. 1,173,187,000 ක් දායක මුදල් ලෙස ලැබී තිබුණු අතර දෙසැම්බර් මාසය සඳහා දායක මුදල් ලැබී නොතිබුණි. 2022 වර්ෂයේ අය වූ දායක මුදල රු. 2,042,513,580 ක් වුයෙන් එයට සාපේක්ෂව මෙම වසරේ දායක මුදල් ලැබීම සියයට 43 කින් අඩු වි තිබුණි. එබැවින් ඉහත අරමුණු ඉටුකර ගැනීම සඳහා අරමුදලේ පැවැත්ම පිළිබඳ ගැටළුකාරී තත්ත්වයක් මතුවී තිබුණි. | අරමුදලේ පැවැත්ම පිළිබඳ ගැටළුකාරී තත්ත්වයක් මතු වී ඇති බව පිළිගනු ඇත. දැනට අරමුදලට ප්‍රතිලාභීන්ගෙන් කිසිදු දායක මුදලක් නොලැබෙන අතර පවතින අරමුදල වැය දරමින් 2024 වර්ෂය තුල විශේෂ නිවාස වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති බව. | අරමුදල පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |